සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus**

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 63 | S | I, II |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

| | | |
|---|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II | පැය තුනයි |
| முயற்சியாண்மைக் கற்கை | I, II | மூன்று மணித்தியாலம் |
| Entrepreneurship Studies | I, II | Three hours |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** ව්‍යවසායකයකු ස්වයං පාලනයක් තුළ කටයුතු කරයි. මෙය හැඳින්විය හැක්කේ
(1) දැක්ම ලෙස ය. (2) නම්‍යතාව ලෙස ය.
(3) අවිනිශ්චිතතාව ලෙස ය. (4) ස්වාධීනත්වය ලෙස ය.

**2.** සෑම සංවිධානයකට ම පොදු ලක්ෂණයක් වනුයේ
(1) අරමුණක් තිබීම ය. (2) ලාභ ඉපයීම ය.
(3) කළමණාකරුවන් සිටීම ය. (4) භෞතික ස්ථානයක් පැවතීම ය.

**3.** කමල්, ආනයනකරුවකුගෙන් භාණ්ඩ මිල දී ගෙන ලාභයක් ඇතිව පාරිභෝගිකයාට අලෙවි කරයි. සුරංග ද තම නිෂ්පාදන ලාභයක් ඇතිව පාරිභෝගිකයාට අලෙවි කරයි.
පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මෙම සිද්ධිය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ
(1) කමල් ව්‍යවසායකයකු වන අතර සුරංග ව්‍යවසායකයකු නොවන බව ය.
(2) සුරංග ව්‍යවසායකයකු වන අතර කමල් ව්‍යාපාරිකයකු වන බව ය.
(3) දෙදෙනා ම ව්‍යවසායකයින් වන බව ය.
(4) දෙදෙනා ම සමාජයීය ව්‍යවසායකයින් වන බව ය.

**4.** ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ඕනෑ ම කෙනෙකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීම වඩාත් ම පහසු කාර්යයක් වේ.
B - ව්‍යවසායකයින් බිහි වන අතර නිර්මාණය කළ නොහැකි ය.
C - ව්‍යවසායකත්වය සඳහා වයස සීමාකාරී සාධකයක් නොවේ.
ඉහත දී ඇති ප්‍රකාශ අතුරෙන් ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A හා B පමණකි. (2) A හා C පමණකි.
(3) B හා C පමණකි. (4) A, B හා C යන සියල්ල ම නිවැරදි ය.

**5.** ව්‍යාපාර ලෝකයේ තරගකාරිත්වය නිරන්තරයෙන් වෙනස් වීමට භාජනය වේ. මෙය හැඳින්විය හැක්කේ
(1) අවිනිශ්චිතතාව ලෙස ය. (2) නිශ්චිතතාව ලෙස ය.
(3) අභියෝගතාව ලෙස ය. (4) ව්‍යාපාර පරිසරය ලෙස ය.

**6.** සංවිධානයක අභ්‍යන්තර සහ බාහිර කණ්ඩායම් සමඟ යහපත් ආකාරයෙන් අදහස් හුවමාරු කර ගැනීමේ කුසලතාව හැඳින්විය හැක්කේ
(1) තාක්ෂණික කුසලතාව ලෙස ය. (2) මානව කුසලතාව ලෙස ය.
(3) සංකල්පනාත්මක කුසලතාව ලෙස ය. (4) විශ්ලේෂණාත්මක කුසලතාව ලෙස ය.

**7.** පාරිභෝගිකයා විසින් ම තම භාණ්ඩ තෝරා ගැනීමේ ක්‍රමය වර්තමානයේ දී බෙහෙවින් ප්‍රචලිත අලෙවි ක්‍රමයකි. මෙම ක්‍රමය හැඳින්විය හැක්කේ
(1) නව සොයා ගැනීමක් ලෙස ය. (2) දිගුවක් ලෙස ය.
(3) අනුකරණය කිරීමක් ලෙස ය. (4) සංකලනයක් ලෙස ය.

[ දෙවැනි පිටුව බලන්න.

8. ව්‍යවසායකයකුගේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - ආත්ම විශ්වාසය හා කැපවීම
B - නිර්මාණශීලිත්වය හා නව්‍යතා සම්පාදනය
C - සෑම ව්‍යාපාරික අවස්ථාවක් ම ප්‍රයෝජනයට ගැනීම
D - තම ප්‍රාග්ධනය මෙන් ම ණය ප්‍රාග්ධනය ද ව්‍යාපාරයට යෙදවීම
ඉහත දැ අතුරෙන් ව්‍යවසායකයකුගේ සාර්ථකත්වය හා බැඳුණු ලක්ෂණ **නොවන්නේ**
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

9. නිර්මාණශීලිත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වනුයේ
(1) අසාර්ථකත්වය ඉවසීම වේ. (2) ගැටළු මග හැරීම වේ.
(3) රීති හා සම්ප්‍රදාය අනුව ක්‍රියා කිරීම වේ. (4) විවිධත්වය ප්‍රතික්ෂේප කිරීම වේ.

10. ව්‍යවසායකත්ව ගතිලක්ෂණ ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) සුභවාදී වීම, නායකත්වය, නොපසුබස්නා උත්සහය
(2) අවදානම් දැරීම, අලෙවිකරණය, නිර්මාණශීලිත්වය
(3) අනාගත දැක්ම, නම්‍යශීලිත්වය, අභිප්‍රේරණය
(4) සන්නිවේදනය, අලෙවිකරණය, සුභවාදී වීම

11. නිර්මාණශීලිත්වයේ ප්‍රතිඵලය වනුයේ
(1) ලාභය උපරිම වීම ය. (2) වෙළෙඳපොළ ආරක්ෂා වීම ය.
(3) නව්‍යතා සම්පාදනය වීම ය. (4) ව්‍යාපාරික අවදානම අවම වීම ය.

12. පියල් නිවාස ඉදිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය තුළින් ඔහු සම්පූර්ණ කරනුයේ
(1) අවශ්‍යතාවකි. (2) වුවමනාවකි. (3) ඉල්ලුමකි. (4) සමාජ වගකීමකි.

13. ව්‍යවසායකයා සහ ව්‍යාපාරිකයා අතර ඇති සමානතාවයක් **නොවන්නේ**
(1) ආර්ථික කටයුත්තක යෙදීම ය. (2) ගනුදෙනුවල නිරත වීම ය.
(3) දිගුකාලීන ඉලක්ක පිහිටුවා ගැනීම ය. (4) පැවැත්ම ගැන සැලකිලිමත් වීම ය.

14. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මෝටර් රථයක් වෙළෙඳපොළට හඳුන්වා දීම සැලකිය හැක්කේ
(1) පවත්නා භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(2) පවත්නා භාණ්ඩයක් නව වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(3) නව භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(4) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙස ය.

15. ව්‍යවසායකයින් සඳහා නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හැඳින්විය හැක්කේ
(1) සීමාකාරී සාධකයක් ලෙස ය. (2) අභියෝගයක් ලෙස ය.
(3) අවස්ථාවක් ලෙස ය. (4) තරගකාරී වාසියක් ලෙස ය.

16. සමස්ත ව්‍යාපාරය සඳහා ම බලපාන්නා වූ සැලසුම් සකස් කිරීම සඳහා වඩා වැදගත් වන කුසලතාව වනුයේ
(1) සංකල්පනාත්මක කුසලතාවයි. (2) මානව කුසලතාවයි.
(3) තාක්ෂණික කුසලතාවයි. (4) උපදේශන කුසලතාවයි.

17. පේටන්ට් බලපත්‍රය යනු
(1) නව සොයාගැනීම් වෙනුවෙන් ලබා දෙන සහතිකයකි.
(2) ව්‍යාපාරය ලියාපදිංචිය සනාථ කර නිකුත් කරන සහතිකයකි.
(3) ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා දෙනු ලබන අවසර පත්‍රයකි.
(4) ව්‍යාපාරයේ නීතිමය පුද්ගලභාවය සනාථ කර නිකුත් කරන සහතිකයකි.

18. සඵලදායී ව්‍යාපාර අදහසක ලක්ෂණයක් වන්නේ
(1) කාරක ප්‍රාග්ධන දුෂ්කරතා අවම කිරීමයි.
(2) වෙනස්වන අවශ්‍යතා හා වුවමනා සම්පූර්ණ කිරීමයි.
(3) ව්‍යාපාරයට ආයෝජකයින් අද්දවා ගැනීමයි.
(4) ව්‍යාපාර කළමනාකරණ කටයුතු සුමටව පවත්වා ගෙන යාමයි.

19. ව්‍යාපාර ආයතනයක ආර්ථික වගකීමක් වනුයේ
(1) සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීමයි. (2) පාරිභෝගික නීතිරීති ආරක්ෂා කිරීමයි.
(3) සමාජයීය ධනය උපරිම කිරීමයි. (4) තරගකාරිත්වයට මුහුණ දීමයි.

[ තුන්වැනි පිටුව බලන්න.

20. ව්‍යවසායකයකුට පරිසර විශ්ලේෂණයකින් ඇති ප්‍රතිලාභයක් වනුයේ
(1) නව ගනුදෙනුකරුවන් ව්‍යාපාරයට අද්දවා ගැනීමට හැකි වීමයි.
(2) ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු ක්‍රමවත් ආකාරයට කළ හැකි වීමයි.
(3) දක්ෂ සේවකයන් ආයතනයට අද්දවා ගත හැකි වීමයි.
(4) ව්‍යාපාරය සඳහා සැලසුම් හා උපායමාර්ග තීරණය කළ හැකි වීමයි.

21. ව්‍යවසායකයකු සැමවිට ම ක්‍රියාත්මක විය යුත්තේ
(1) ව්‍යාපාරික අරමුණු පමණක් ලඟා කර ගැනීම සඳහා ය.
(2) සමාජයීය අරමුණු පමණක් ලඟා කර ගැනීම සඳහා ය.
(3) තරගකාරී වාසි උපරිම කර ගැනීම සඳහා ය.
(4) ව්‍යාපාරික මෙන් ම සමාජයීය අරමුණු ද ලඟා කර ගැනීම සඳහා ය.

22. වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ලක්ෂණයක් වනුයේ
(1) පරිසර සාධකවල දැඩි නොවෙනස් බවයි.
(2) දැඩි තරගකාරිත්වයයි.
(3) පුද්ගලයින් තම අවශ්‍යතා හා වුවමනා අවම මට්ටමකින් සපුරා ගැනීමට උත්සහ කිරීමයි.
(4) මිනිස් වුවමනා සම්පූර්ණ කිරීමට ඇති භාණ්ඩ හා සේවා සීමා සහිත වීමයි.

23. භාණ්ඩ හා සේවා කුමක්, කෙසේ, කොපමණ නිපදවන්නේ ද යන තීරණය ගනු ලබන්නේ
(1) ව්‍යවසායකයින් විසින් ය.
(2) ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ය.
(3) නිෂ්පාදකයින් විසින් ය.
(4) මධ්‍යම රජය විසින් ය.

24. ව්‍යවසායකයින් විසින් නිර්මාණය කර සම්පූර්ණ කරනුයේ පුද්ගල
(1) අවශ්‍යතා ය.
(2) වුවමනා ය.
(3) අරමුණු ය.
(4) අපේක්ෂා ය.

25. ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම තුළින් ලැබිය හැකි ප්‍රතිලාභයක් වනුයේ
(1) උද්ධමනය අඩු කරගත හැකි වීමයි.
(2) සමාජ පිරිවැය අවම කර ගත හැකි වීමයි.
(3) භාවිත නොවන සම්පත් භාවිතයට ගත හැකි වීමයි.
(4) අපනයන වර්ධනය කර ගත හැකි වීමයි.

26. සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අකමැත්ත නිසා
(1) නව්‍යතා සම්පාදනය සීමා කෙරේ.
(2) ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වේ.
(3) ලාභයට බලපෑම් ඇති නොවේ.
(4) භාණ්ඩවල ගුණත්වය තහවුරු වේ.

27. හවුල් ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනුයේ
(1) ප්‍රාදේශීය ලේකම් විසිනි.
(2) පළාත් සභා ලේකම් විසිනි.
(3) ග්‍රාම නිලධාරී විසිනි.
(4) සමාගම් රෙජිස්ට්‍රාර් විසිනි.

28. සමාගමේ පරමාර්ථ, කොටස්හිමියන්ගේ බැඳීම් හා අයිතිවාසිකම් යන තොරතුරු ඇතුළත් ලියවිල්ල වනුයේ
(1) සාංගමික ව්‍යවස්ථාවලියයි.
(2) වෙළෙඳ සහතිකයයි.
(3) සංස්ථාපන සහතිකයයි.
(4) ව්‍යාපාර ලියාපදිංචි සහතිකයයි.

29. ව්‍යවසායකයකු විසින් නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීමේ මූලික අරමුණ වනුයේ
(1) විකුණුම් පිරිවැය ගණනය කිරීමයි.
(2) නිෂ්පාදනයේ මිල ගණනය කිරීමයි.
(3) නිෂ්පාදනයේ ලාභ ආන්තිකය තීරණය කිරීමයි.
(4) ඒකක පිරිවැය ගණනය කිරීමයි.

30. කාර්යාල උපකරණ ක්ෂය
(1) නිෂ්පාදන පිරිවැයට අයත් වියදමකි.
(2) අලෙවිකරණ පිරිවැයට අයත් වියදමකි.
(3) මූල්‍ය පිරිවැයට අයත් වියදමකි.
(4) පරිපාලන පිරිවැයට අයත් වියදමකි.

31. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කරන ගොඩනැගිලි කුලිය සැලකිය හැක්කේ
(1) නිෂ්පාදන සැලැස්මේ අයිතමයක් ලෙස ය.
(2) අලෙවිකරණ සැලැස්මේ අයිතමයක් ලෙස ය.
(3) මූල්‍ය සැලැස්මේ අයිතමයක් ලෙස ය.
(4) කළමනාකරණ සැලැස්මේ අයිතමයක් ලෙස ය.

32. අලෙවිකරණ උපායමාර්ග තීරණය කිරීම සඳහා සලකා බැලිය යුත්තේ
(1) වෙළෙඳපොළ විශ්ලේෂණයකි.
(2) තරගකරුවන් පිළිබඳ විශ්ලේෂණයකි.
(3) මිල පිළිබඳ විශ්ලේෂණයකි.
(4) නිෂ්පාදන විශ්ලේෂණයකි.

33. ව්‍යාපාරය විසින් එහි අයිතිකරුවන්ගේ ආයෝජනයට උපරිම ප්‍රතිලාභ ලබා දිය යුතු ය. මෙය,
(1) කළමනාකරුවන්ගේ යුතුකමකි.
(2) සමාජ වගකීම සම්බන්ධයෙන් වූ නූතන අදහසකි.
(3) සමාජ වගකීම සම්බන්ධයෙන් වූ සම්ප්‍රදායික අදහසකි.
(4) ව්‍යාපාර ආචාර ධර්ම සම්බන්ධයෙන් වන වගකීමකි.

[ හතරවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**34.** අරවින්ද ව්‍යාපාරයක හිමිකරු වන අතර ප්‍රධාන විධායක නිලධාරියා ද වන්නේ ය. ඔහු විසින් තම ව්‍යාපාරය සඳහා බලපානු ලබන සමස්ත සැලැස්ම සකස් කළේ ය. එම කාර්ය අයත් වනුයේ
(1) නායකයා ලෙස වූ භූමිකාවට ය.
(2) කළමනාකරු ලෙස වූ භූමිකාවට ය.
(3) අයිතිකරු ලෙස වූ භූමිකාවට ය.
(4) ප්‍රධාන විධායක නිලධාරියා ලෙස වූ භූමිකාවට ය.

**35.** නිමල් ඉතා දිගු කාලයක් පාවිච්චි කළ හැකි ආකාරයට සාම්ප්‍රදායික මෝස්තරයේ ස්වර්ණාභරණ නිෂ්පාදනය කරයි. ඉහත ප්‍රකාශයෙන් අනුපිළිවෙළින් පෙන්වනු ලබනුයේ නිමල්ගේ ව්‍යාපාරයේ
(1) දුර්වලතාවයක් හා ශක්තියකි.
(2) ශක්තියක් හා දුර්වලතාවයකි.
(3) අවස්ථාවක් හා ශක්තියකි.
(4) අභියෝගයක් හා දුර්වලතාවයකි.

- පහත සිද්ධිය කියවා අංක **36** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රංග, තමාට ඕනෑ ම අරමුණක් සාර්ථකව ළඟා කර ගත හැකි බව විශ්වාස කරන තරුණ ව්‍යවසායකයෙකි. ඔහු තමා වෙත එල්ල වන ඕනෑ ම ගැටළුවක් අභියෝගයක් ලෙස බාර ගනී. එහෙත් රංග නොයෙක් සමාජයීය විශ්වාසයන් හා ආකල්ප කෙරෙහි ද තදබල ලෙස බැඳී ඇත. ඔහු වෙළෙඳපොළ වෙනස්වීම් සහ ප්‍රජා පරිසරයේ වෙනස්වීම් නිරන්තරයෙන් අධ්‍යයනය කර තම ව්‍යාපාරික සැලසුම් සකස් කරයි.

**36.** සමාජයීය විශ්වාසයන් හා ආකල්ප කෙරේ බැඳී පැවතීමෙන් වඩාත් ම ගම්‍ය වනුයේ රංග
(1) ආයතනික ව්‍යවසායකයකු බව ය.
(2) නිර්මාණශීලී ව්‍යවසායකයකු නොවන බව ය.
(3) සමාජයීය ව්‍යවසායකයකු බව ය.
(4) වෙළෙඳපොළ අභිමුඛ ව්‍යවසායකයකු බව ය.

**37.** ප්‍රජා පරිසරය අධ්‍යයනයෙන් හඳුනාගත හැකි සාධකයක් වනුයේ
(1) පාරිභෝගික ආකල්ප ය.
(2) ආදායම් වෙනස්වීම ය.
(3) තාක්ෂණික වෙනස්වීම ය.
(4) පාරිභෝගික වයස ය.

**38.** වෙළෙඳපොළ විශ්ලේෂණය තුළින් හඳුනාගත හැකි සාධකයක් **නොවන්නේ**
(1) පාරිභෝගික ආකල්ප වේ.
(2) පාරිභෝගික වයස වේ.
(3) නිෂ්පාදිතයක ඒකක පිරිවැය වේ.
(4) ඉලක්කගත පාරිභෝගිකයන් වේ.

**39.** සැලසුම් සෑමවිට ම
(1) අනාගතය හා සම්බන්ධ කරයි.
(2) වර්තමාන තත්ත්වය පැහැදිලි කරයි.
(3) අතීතය විශ්ලේෂණය කරයි.
(4) තරගකාරිත්වය පැහැදිලි කරයි.

**40.** වෙළෙඳපොළ විශ්ලේෂණය තුළින් හඳුනාගත හැක්කේ ව්‍යාපාරික
(1) ශක්තීන් ය.
(2) දුර්වලතා ය.
(3) අවස්ථා ය.
(4) ප්‍රාග්ධන අවශ්‍යතා ය.

* *

/ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | |
|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II |
| முயற்சியாண்மைக் கற்கை | I, II |
| Entrepreneurship Studies | I, II |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රෝසි මහත්මිය බුද්ධිමත්, නිර්මාණශීලී හා ඉතාමත් ක්‍රියාශීලී කාන්තාවකි. විශ්ව විද්‍යාල උපාධිධාරිනියක් ද වන ඇය ඉතා දක්ෂ ගෘහණියක් ද වේ. පාසල් කාලයේ සිට නොයෙක් ආකාරයේ කෘතිම ආභරණ නිර්මාණය කිරීමට ලැදිකමක් දැක්වූ ඇය නිර්මාණ කිරීම තම විනෝදාංශය කර ගත්තා ය. විවිධ ප්‍රදර්ශනවලට සහභාගී වෙමින් ඇය ලත් අත්දැකීම් මත නව විලාසිතා ද නිර්මාණය කළා ය. රෝසි මහත්මිය 2017 වසරේ දී අත්කම් ප්‍රදර්ශනයකට සහභාගී වෙමින් තමා මෙතෙක් නිර්මාණය කරන ලද කෘතිම ආභරණ සියල්ල ප්‍රදර්ශනයට ඉදිරිපත් කළා ය. එහි දී ඇයගේ නිර්මාණ දේශීය මෙන් ම විදේශීය ගනුදෙනුකරුවන්ගේ ද ප්‍රසාදයට ලක් වූ අතර ඇණවුම් කිහිපයක් ද ලැබුණි.

තම විනෝදාංශය හා ලැදියාව ව්‍යාපාරික අදහසක් බවට පත් කිරීමට සිතූ ඇය තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට කිසිදු බාධාවක් නොකරන බව දක්වමින් තම සැමියාගෙන් මේ සඳහා අවසර ලබා ගත්තා ය. තමා ආරම්භ කිරීමට අදහස් කරන ව්‍යාපාරය ස්ථාවර කිරීමේ අරමුණ ඇතිව තම ස්වාමියා හා තවත් මිතුරෙකු ද එකතු කර ගනිමින් සී/ස පෞද්ගලික සමාගමක් ලෙස ආරම්භ කර ලියාපදිංචි කිරීමට ඇය තීරණය කළා ය. දේශීය මෙන් ම විදේශීය වෙළෙඳපොළ ද ජය ගැනීම ඇයගේ ඉලක්කය විය.

(i) රෝසි මහත්මිය විසින් ආරම්භ කිරීමට අදහස් කරන ව්‍යාපාරයේ, ව්‍යාපාර අදහස් මූලාශ්‍රය සඳහන් කරන්න.

(ii) ඉහත සිද්ධිය ඇසුරෙන් කාන්තා ව්‍යවසායකත්වයේ වාසි **දෙකක්** සහ කාන්තා ව්‍යවසායකත්වයට ඇති බාධා **දෙකක්** දක්වන්න.

(iii) රෝසි මහත්මිය ආරම්භ කිරීමට අදහස් කරන ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි **හතරක්** සඳහන් කරන්න.

(iv) රෝසි මහත්මියට සිය කෘතිම ආභරණ ප්‍රවර්ධනය කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම **හතරක්** දක්වන්න.

(v) රෝසි මහත්මියගේ ව්‍යාපාරයට මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබා දිය හැකි ආයතන දෙක බැගින් වෙන වෙන ම සඳහන් කරන්න.

- ඉහත සිද්ධියෙන් යෝජිත ව්‍යාපාරයේ ඉදිරි වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දී ඇත.

| | රු. |
|---|---|
| යන්ත්‍ර හා උපකරණ | 100 000 |
| කොටස් ප්‍රාග්ධනය | 1 500 000 |
| අලෙවි රථය | 1 000 000 |
| ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ වියදම් | 40 000 |
| ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමේ වියදම් | 20 000 |
| කාර්යාල උපකරණ | 300 000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 400 000 |
| විදුලිය | 25 000 |
| සේවක වැටුප් | 100 000 |
| නඩත්තු වියදම් | 40 000 |
| බැංකු ණය | 800 000 |

ඉහත තොරතුරු ඇසුරෙන්,

(vi) රෝසිගේ ව්‍යාපාරයේ මුළු මුදල් ගලාඒම් ගණනය කරන්න.

(vii) රෝසිගේ ව්‍යාපාරයේ මුළු මුදල් ගලායාම් ගණනය කරන්න.

(viii) නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට යොදා ගනු ලබන අයිතම **තුනක්** සඳහන් කරන්න.

(ix) ව්‍යාපාරයට අදාළ ආරම්භ කිරීමට පෙර වියදම් **දෙකක්** දක්වන්න.

(x) වර්ෂය අවසානයේ ඇස්තමේන්තුගත මුදල් ශේෂය ගණනය කර දක්වන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

[ හයවැනි පිටුව බලන්න.

**2.** (i) වර්තමාන පරපුර ඉතා දැඩි ලෙස තම සෞඛ්‍ය ගැන සැලකිලිමත් වේ. මේ සම්බන්ධයෙන් ව්‍යවසායකයකුට හඳුනාගත හැකි ව්‍යාපාර අවස්ථා **තුනක්** දක්වන්න.
(ii) ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි කළමනාකරුවන් වර්ග **හතරක්** දක්වන්න.
(iii) මූල්‍ය සැලැස්මක් මගින් ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රයෝජන **හතරක්** දක්වන්න.
(iv) කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථකවීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න.
(v) ව්‍යාපාරයක් සඳහා බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීමේ දී බැංකුවට ඉදිරිපත් කළ යුතු ලියවිලි **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

**3.** (i) වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම සඳහා ව්‍යවසායකයකුට භාවිත කළ හැකි ක්‍රම **හතරක්** දක්වන්න.
(ii) අලෙවිකරණ උපායමාර්ග තීරණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන විචල්‍ය **හතර** සඳහන් කරන්න.
(iii) ශ්‍රී ලංකාවේ දැකිය හැකි, ලාභ ඉපයීම අරමුණු කර ගත් ව්‍යාපාර **දෙකක්** සහ ලාභ ඉපයීම අරමුණු කර නොගත් ව්‍යාපාර **දෙකක්** සඳහා උදාහරණ දක්වන්න.
(iv) සුරනිමල තම ව්‍යාපාරය සඳහා පියල්ගෙන් ගත් ණය මුදල නොගෙවීම නිසා පියල් සුරනිමලට විරුද්ධව නඩු පවරයි. කේවල ස්වාමි ව්‍යාපාර සම්බන්ධයෙන් ඉහත තත්ත්වය පැහැදිලි කරන්න.
(v) සී/ස පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ව්‍යවසායකයකු විසින් ඉදිරිපත් කළ යුතු ලියවිලි **හතර** මොනවා ද?
(ලකුණු 02 × 05 = 10 යි)

**4.** (i) ව්‍යවසායකයන් වර්ග **තුන** නම් කර, එම එක් එක් වර්ගය සඳහා උදාහරණය බැගින් ලියන්න.
(ii) ව්‍යවසායකයකු විසින් ජාතික ආර්ථිකය සඳහා කරනු ලබන දායකත්ව **හතරක්** දක්වන්න.
(iii) ව්‍යවසායකයන්ගේ නිර්මාණශීලීත්වය සීමා කරනු ලබන සාධක **දෙකක්** සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකයකු සතුවිය යුතු කණ්ඩායම් කුසලතා හා සංකල්පනාත්මක කුසලතා **දෙක** බැගින් දක්වන්න.
(v) මෑතකාලයේ දී ව්‍යවසායකයින් විසින් මිනිස් වුවමනා ඉටු කිරීම සඳහා නිර්මාණය කර ඉදිරිපත් කරන ලද භාණ්ඩ හෝ සේවා **දෙකක්** දක්වන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

**5.** (i) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යවසායකයකුට ලඟා කර ගත හැකි ප්‍රයෝජන **හතරක්** දක්වන්න.
(ii) ව්‍යාපාරයක ආචාරධර්ම තීරණයවීමෙහි ලා බලපෑම් කරනු ලබන ප්‍රධාන පාර්ශ්ව **තුන** සඳහන් කරන්න.
(iii) ශ්‍රී ලංකාවේ මූලික ව්‍යාපාර අංශ **තුන** දක්වා, ඒ එකිනෙක සඳහා උදාහරණය බැගින් ලියන්න.
(iv) මානව නොවන සම්පත් භාවිත කොට ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථා **හතරක්** දක්වන්න.
(v) අභ්‍යන්තර ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කිරීම තුළින් ව්‍යවසායකයකුට හඳුනාගත හැකි දුර්වලතා **දෙකක්** සඳහන් කර, එය මගහරවා ගත හැකි ක්‍රම **දෙකක්** ද දක්වන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

**6.** (i) ව්‍යාපාරික අදහස් උත්පාදනය වන මූලාශ්‍ර **හතරක්** දක්වන්න.
(ii) ව්‍යාපාරයක සමාජ වගකීම් මට්ටම් නම් කරන්න.
(iii) පහත සඳහන් පාර්ශ්ව සඳහා ව්‍යාපාර සැලැස්මක ඇති ප්‍රයෝජන **දෙක** බැගින් දක්වන්න.
(අ) ව්‍යවසායකයින්
(ආ) මූල්‍ය ආයතන
(iv) නිමල්ට කමිස 200 ක ඇණවුමක් ලැබී ඇත. මෙම ඇණවුම සම්පූර්ණ කිරීමේ දී නිමල්ට දැරීමට සිදු වන පරිපාලන වියදම් **හතරක්** දක්වන්න.
(v) නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීමේ දී ව්‍යවසායකයකු විසින් සැලකිල්ලට ගත යුතු සාධක **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

**7.** සිය ප්‍රදේශයේ අයිස්ක්‍රීම් නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළ රුසිරු, සිය ව්‍යාපාර සැලසුම සකස් කිරීමට අදාළ තොරතුරු රැස් කරන ලදී. දැනට අයිස්ක්‍රීම් සඳහා වෙළෙඳපොළ තුළ පවතින මාසික ඉල්ලුම පහත දැක්වේ.

| අයිස්ක්‍රීම් වර්ගය | මාසික ඉල්ලුම (ඒකක) | ඒකක මිල (රු.) |
|---|---|---|
| වැනිලා | 15 000 | 80 |
| චොකලට් | 14 000 | 90 |
| පලතුරු | 10 000 | 60 |

දැනට පවතින ඉල්ලුමෙන් 10% ක් අත්පත් කර ගැනීමට රුසිරු තීරණය කර ඇත.
ව්‍යාපාරයට අදාළ මාසික අලෙවි වියදම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| අලෙවි සේවක වැටුප | 12 000 |
| ප්‍රචාරණ වියදම් | 5 000 |
| අලෙවි රථ රක්ෂණ | 5 000 |
| ඉන්ධන හා සේවා වියදම් | 8 000 |

ව්‍යාපාරය සඳහා රු. 700 000 ක් වටිනා වෑන් රථයක් මිලට ගැනීමට රුසිරු අදහස් කරන අතර එහි වාර්ෂික ක්ෂය අනුපාතය 10% කි.
ඉහත තොරතුරු ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.
(i) භාණ්ඩවලට අදාළ මුළු වාර්ෂික ඉල්ලුම (ඒකක) (ලකුණු 03 යි)
(ii) ව්‍යාපාරයට අදාළ වාර්ෂික විකුණුම් පුරෝකථනය (රු.) (ලකුණු 03 යි)
(iii) ව්‍යාපාරයේ මුළු වාර්ෂික අලෙවි වියදම (ලකුණු 04 යි)
(මුළු ලකුණු 10 යි)

* * *

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 10-11 සිංහල ව්‍යාකරණ
- 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- බුද්ධ ධර්මය
- කතෝලික ධර්මය
- සිංහල භාෂාව හා සාහිත්‍යය
- සිංහල සාහිත්‍යය සංග්‍රහය
- English Language
- ගණිතය - 1
- ගණිතය - 2
- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- ඉතිහාසය
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ඉතිහාසය
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education
- 10-11 English Literary (Poetry)
- 10-11 English Literary (Drama)
- 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- බුද්ධ ධර්මය
- කතෝලික ධර්මය
- සිංහල භාෂාව හා සාහිත්‍යය
- සිංහල සාහිත්‍යය සංග්‍රහය
- සිංහල රචනා අත්වැල
- English Language
- ගණිතය - 1
- ගණිතය - 2
- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් ඇශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.